| |
|---|
| කැලණිය අධ්‍යාපන කලාපය |
| දෙවන වාර පරීක්ෂණය - 2017 |
| 11 ශ්‍රේණිය    පෙරදිග සංගීතය I    කාලය පැය 03 |
| නම : ........................................................................................ |

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. කල්‍යාණ මේලයෙන් බිහිවන සම්පූර්ණ ජාති රාගයක් වන්නේ,
    (i) බිලාවල්   (ii) භූපාලි   (iii) යමන්   (iv) භෛරවී

02. වාදී සංවාදී ස්වර පිළිවෙළින් ම සහ ස වශයෙන් යෙදෙන සම්පූර්ණ ජාති රාගයකි,
    (i) භීමපලායි   (ii) කාෆි   (iii) බිලාවල්   (iv) භෛරවී

03. | සරි ගුම පධ නිසා | නිධ පම ගුරි ස- | ඉහත සඳහන් තානාලංකාරය,
    (i) යමන් රාගයට අදාළව නිර්මාණය වී ඇත.
    (ii) කාෆි රාගයට අදාළව නිර්මාණය වී ඇත.
    (iii) භීමපලාසි රාගයට අදාළව නිර්මාණය වී ඇත.
    (iv) භෛරවී රාගයට අදාළව නිර්මාණය වී ඇත.

04. ''ගුමු ගුමුව වදුලේ'', ''මන්නාරම්පිටි වැල්ලේ'' යන ගීත නිර්මාණය වී ඇත්තේ,
    (i) භූපාලි රාගය ආශ්‍රය කරගෙනය.   (ii) යමන් රාගය ආශ්‍රය කරගෙනය.
    (iii) බිලාවල් රාගය ආශ්‍රය කරගෙනය.   (iv) කාෆි රාගය පදනම් කරගෙනය.

05. ''ප ස වාදී සංවාදී වේ.'' මෙම ගී පාදය ............ රාගයට අදාළ වේ.
    (i) භෛරවී   (ii) කාෆි   (iii) භූපාලි   (iv) බිලාවල්

06. | නි ධ ම | ප ගු රි | ස රි ගු | ම ප - | යන ස්වර ඛණ්ඩය,
    (i) භීමපලාසි රාගයේ සර්ගම් ගී පාදයකි.
    (ii) කාෆි රාගයේ සර්ගම් ගී පාදයකි.
    (iii) භෛරවී රාගයේ මධ්‍යලය ගීතයේ ස්වර පේළියකි.
    (iv) භෛරවී රාගයේ ලක්ෂණ ගීයේ එන ස්වර ඛණ්ඩයකි.

07. * කණ්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා.
    * නිල් අහස් තලේ අගේ

    ඉහත ගී පාද දෙකට අදාළ වන නිවැරදි පිළිතුරක් නොවන්නේ,
    (i) පළමු ගී පාදය ගැමි ගීයකි. දෙවන ගී පාදය මැදුම් තනි තිතට අනුව ගැයෙන්නෙකි.
    (ii) පළමු ගී පාදය අනාඝාතාත්මකව ගැයේ, දෙවන ගී පාදය අඝාතාත්මකව ගායනය කරයි.
    (iii) පළමු ගී පාදය ගායනයේදී උඩැක්කිය හෝ රබාන වැයීම සුදුසු වේ, දෙවන ගී පාදය ගායනයේදී තබ්ලාව වැයීම සුදුසු වේ.
    (iv) පළමු ගී පාදය මෙහෙ ගීයක් වන අතර, දෙවන ගී පාදය සරල ගීයක් වේ.

08. එක සමාන මාත්‍රාවලින් යුක්තව විභාගවන තාල දෙකකි,
(i) ත්‍රිතාල් - කෙහෙර්වා (ii) ඣප්තාල් - දීප්චන්දි
(iii) බෙම්පටෝ තාලය - ඣප්තාලය (iv) දීප්චන්දි - කෙහෙර්වා

09. නිවැරදි ස්වරස්ථාන සහිතව ගායනය කිරීමට උපකාරීවන සංගීත භාණ්ඩයකි,
(i) තබ්ලාව (ii) සිතාරය (iii) වයලීනය (iv) ස්වර පුවරු භාණ්ඩ

10. G මේජර් ස්කේලය ස්වර පුවරුවෙන් වාදනය කරනවිට අර්ධ ස්වර පරතරයන් පිහිටනුයේ,
(i) මප සහ නිස ස්වර අතරය. (ii) ගම සහ නිස ස්වර අතරය.
(iii) නිස සහ ම́ප ස්වර අතරය. (iv) ම́ප සහ ධනි̱ ස්වර අතරය.

1. | ස රි ග | ධ ප ග | ස̇ ධ ප | ග - - |
2. | නි̣ රි ග | ප ම́ රි | ග රි නි̣ | ස - - |

11. ඉහත ස්වර පාද දෙක කුමන රාගවලට අයත් වේද?
(i) බිලාවල් - යමන් (ii) භූපාලි - යමන් (iii) බිලාවල් - භූපාලි (iv) භූපාලි - කාෆි

12. මෙම ස්වර ප්‍රස්තාරය බටහිර ප්‍රස්තාර ක්‍රමයට ලිවීමේදී යොදනු ලබන ටයිම් සිග්නේචරය වන්නේ,
(i) $\frac{3}{4}$ (ii) $\frac{4}{4}$ (iii) $\frac{3}{3}$ (iv) $\frac{6}{8}$

13. දෙවන ස්වර පාදය පංචමභාවයෙන් මෙසේ වේ.
(i) ම ප ධ | ස̇ ධ ප | ධ ප ම | ප - - | (ii) ම ප ධ | ස̇ නි ප | ධ ප ග | ම - - |
(iii) ම́ ධ නි | රි̇ රි̱ ධ | නි ධ ම́ | ප - - | (iv) ග ප ධ | ස̇ නි ප | ධ ප ග | ම - - |

14. ඔබ විෂය නිර්දේශයේ සම්පූර්ණ ජාති ගණයට අයත් රාග සංඛ්‍යාව,
(i) දෙකකි. (ii) තුනකි. (iii) හතරකි. (iv) පහකි.

15. තාල පද අතින් තාල දැමීමේදී, සමග්‍රහය හැර අත්පුඩියක් ගසා තාල ස්ථාන පෙන්වන අවස්ථා,
(i) බලිස්ථාන වශයෙන් හඳුන්වයි. (ii) අනුතාල ස්ථාන වශයෙන් හඳුන්වයි.
(iii) සමස්ථාන නමින් හඳුන්වයි. (iv) විෂම තාල ස්ථාන ලෙස හඳුන්වයි.

16. කෝකිල වන්නම ගායනය කරන විට තබ්ලාව වාදනය කරනු ලැබුවහොත් ඊට සුදුසු තාල වන්නේ,
(i) දාදරා සහ බෙම්ටෝ තාල දෙකයි. (ii) බෙම්ටෝ සහ දීප්චන්දි තාල දෙකයි.
(iii) කෙහෙර්වා සහ ජප් තාල දෙකයි. (iv) බෙම්ටෝ සහ ජප් තාල දෙකයි.

17. කෝකිල වන්නම ගායනයේදී සාම්ප්‍රදායිකව වයනු ලබන අවනද්ධ භාණ්ඩය,
(i) ආතත ගණයට අයත් වේ. (ii) විතත ගණයට අයත් වේ.
(iii) විතතාතත ගණයට අයත් වේ. (iv) ඝණ වාද්‍ය භාණ්ඩවලට අයත් වේ.

| A | B | C | D |
|---|---|---|---|
| ධා ධ්‍රි̱ ධ්‍රි̱ ධා | ධා තු නා | ත ත්‍රිං S | ති නා |

ඉහත අවනද්ධ අක්ෂර ඇතුළත් විභාග හතර උපයෝගී කරගෙන පහත ප්‍රශ්න 03 ට පිළිතුරු සපයන්න.

18. දාදරා තාලය සඳහා වැයෙන අවනද්ධ අක්ෂර ඇතුළත් වනුයේ,
(i) A කොටසේය. (ii) B කොටසේය. (iii) C කොටසේය. (iv) D කොටසේය.

19. අතින් තාල තැබීමේදී අත්පුඩියක් නොගසා අත පිටට දමා තාල නිරූපණය කරන අවස්ථා ඇතුළත් විභාග ඇත්තේ,
(i) A සහ B කොටස්වලය (ii) A සහ C කොටස්වලය
(iii) A සහ D කොටස්වලය (iv) B, C සහ D කොටස්වලය

20. ඉහත සඳහන් අවනද්ධ අක්ෂර ඇතුළත් විභාගවලින් එකක්, දෙවතාවක් යොදන තාල පදයකි,
(i) දාදරා (ii) ජප්තාල් (iii) කෙහෙර්වා (iv) ත්‍රිතාල්

21. ම සහ නි යන ස්වර ඇතුළත් නොවූ රාගයකි,
(i) යමන් (ii) කාෆි (iii) භෛරවී (iv) භූපාලි

22. මගමරිසරිස- , ගරිගපධනිස- යන ස්වර සංගති යෙදෙන්නේ,
(i) භූපාලි රාගයේ ය. (ii) බිලාවල් රාගයේ ය.
(iii) කාෆි රාගයේ ය. (iv) යමන් රාගයේ ය.

23. සඩ්ජය ශ්‍රැතිය කරගනිමින් ඔබ විෂය නිර්දේශයට අයත් රාග වාදනය කිරීමේදී ස්වර පුවරුවේ වැඩිම කලු යතුරු සංඛ්‍යාවක් භාවිතා වන්නේ,
(i) යමන් රාගය සඳහා ය. (ii) කාෆි රාගය සඳහා යි.
(iii) භීමපලාසි රාගය සඳහා ය. (iv) භෛරවී රාගය සඳහා යි.

24. රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයෙන රාග අතුරෙන් අඩු ස්වර සංඛ්‍යාවක් සහිත රාගයකි,
(i) යමන් (ii) භූපාලි (iii) කාෆි (iv) භෛරවී

25. යමන් රාගයේ නාද මාලාව ඇසුරු කරගනිමින් නිර්මාණය වූ ගීතයකි,
(i) අඳුර අඳුර මගේ (ii) ගුමු ගුමුව වදුලේ (iii) එන්න මදනලේ (iv) සැදෑ අඳුරු ලොව

26. පහත රට සින්දු වන්නම ගැයෙන තිත,
(i) මැදුම් තනි තිතයි. (ii) මහ තනි තිතයි. (iii) සුලු මැදුම් දෙතිතයි. (iv) මැදුම් මහදෙතිතයි.

27. සංධ්වනි වාද්‍යවෘන්ද (Symphony orchestra) පිළිබඳව වර්තමානයේ බිහි වූ විශිෂ්ඨ සංගීතඥයෙකි,
(i) බේතෝවන් (ii) මෝසාට් (iii) යානි (iv) හයිඩ්න්

28. ස ග ප , ම ධ ස , ස ග ප , ප නි රි මෙම ස්වර ඛණ්ඩ හතර,
(i) C මේජර් , F මයිනර් , C මයිනර් , G මේජර් වේ.
(ii) C මයිනර් , F මේජර් , C මේජර් , G මයිනර් වේ.
(iii) C මයිනර් , F මයිනර් , C මේජර් , G මයිනර් වේ.
(iv) C මේජර් , F මේජර් , C මයිනර් , G මේජර් වේ.

* **29 සහ 30 ප්‍රශ්න සඳහා පහත ඛණ්ඩ දෙක යොදාගන්න.**

| ස - ග | ප - - | ධ - ම | ග - - |
| රි නි ප | රි - - | ග - ප | ග - - |

29. ඉහත ස්වර ඛණ්ඩ දෙක සඳහා වඩාත් සුදුසු කෝඩ්ස් වන්නේ,
(i) | C | G | F | C | G | G | C | C |
(ii) | C | G | F | C | G | D | $E^m$ | C |
(iii) | C | C | F | C | G | G | C | C |
(iv) | C | G | F | E | G | D | E | E |

30. ඉහත ස්වර ඛණ්ඩ දෙකෙන් පළමු ස්වර ඛණ්ඩය සඳහා වඩා සුදුසු භාමනි කොටස වන්නේ,

(i) ග - ප | ස̇ - - | ස̇ - ධ | ප - - | (ii) ග - ග | නි - - | ස̇ - ධ | ප - - |

(iii) ප - ග | ස̇ - - | ම - ධ | ග - - | (iv) ග - ප | රි - - | ම - රි | ස - - |

31. නූර්ති ගීවල දක්නට ලැබෙන සංගීතමය ලක්ෂණයකි,

(i) උරුට්ටුව (ii) දොහොරාව (iii) ඉන්නිසය (iv) තෝඩායම

32. 

ඉහත සංකේත පිළිවෙළින්,

(i) ක්‍රොචට්, සෙමිබ්‍රීව්, මිනිම්, ක්වේවර් වේ.

(ii) ඩොටඩ් ක්වේවර්, මිනිම්, කොචට්, ක්වේවර් වේ.

(iii) ඩොටඩ් ක්‍රොචට්, සෙමිබ්‍රීව්, මිනිම්, ක්‍රොචට් වේ.

(iv) ඩොටඩ් ක්‍රොචට්, සෙමිබ්‍රීව්, මිනිම්, ක්වේවර් වේ.

33. බෙම්ටෝ තාලයට අනුව ගැයෙන ගීතයකි,

(i) සෝබාව දේ. (ii) රනදූර සිරියා පරදන

(iii) සත් සියක් කපු මල් රැගෙන මම (iv) සුවඳ පද්ම ඕලු ආදී

34. ගැමි ගී සම්බන්ධව අදාළ නොවන පිළිතුරකි,

(i) කෙටි ස්වර පරාසයකින් යුක්ත වීම. (ii) නිර්මාපකයා නිර්ණාමික වීම.

(iii) වියත් බස්වහරකින් යුක්ත වීම. (iv) ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගීත සහිත බව.

35. බටනලා වාදනයේ ප්‍රචලිත සංගීතඥයෙකි,

(i) ඔස්තාද් ශකීර් හුසේන් (ii) හරි ප්‍රසාද් චෞරාසියා

(iii) පණ්ඩිත් රවි ශංකර් (iv) පන්ඩිත් සහීඩ් පර්වේස්

36. රාගයක විස්තර ඇතුළත් ගීත,

(i) ඛ්‍යාල් ගීත වේ. (ii) ලක්ෂණ ගීත වේ.

(iii) සර්ගම් ගීත වේ. (iv) මධ්‍යලය ගී වේ.

37. පහත සඳහන් තාල අතුරින් සමස්ථානයක් (සම්) නොමැති තාලය,

(i) බෙම්ටෝ වේ. (ii) රූපක් වේ. (iii) දීප්චන්දි වේ. (iv) ජප් තාලය වේ.

38. Acropolis (අක්‍රොපොලිස්), Tribute (ට්‍රිබියුට්) යන නිර්මාණ ඉදිරිපත් කළ සංගීතඥයා වන්නේ,

(i) ඩබ්ලිව්.ඒ. මොසාර්ට් ය. (ii) එල්.වී. බේතෝවන් ය.

(iii) යානි ය. (iv) ඒ.ආර්. රහුමාන් ය.

39. රි ම ධ යන ස්වර,

(i) යමන් රාගයේ පූර්වාංගයේ යෙදෙන ස්වර තුනකි.

(ii) රිෂභය ශ්‍රැති වශයෙන් ගත්විට D මේජර් කෝඩ් එකේ ස්වර වේ.

(iii) බටහිර ස්වර ප්‍රස්තාර කිරීමේදී රේඛා මත පිහිටන ස්වර 3 කි.

(iv) D minor ස්කේලයේ ස්වර වේ.

40. එකම වර්ගයේ අවනද්ධ භාණ්ඩ දෙකක් තාල වාදනය සඳහා යොදාගත් නාට්‍ය ශෛලිය වන්නේ,

(i) සොකරි නාට්‍ය (ii) කෝලම් නාට්‍ය (iii) නාඩගම් නාට්‍ය (iv) නූර්ති නාට්‍ය



(ල.01×40=40ල.)

කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

11 ශ්‍රේණිය | පෙරදිග සංගීතය II | කාලය පැය 03

නම : ..................................................................................................

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) | ග රි ස ධ | ප ධ ස රි | ග - ග රි | ග ප ග - |
මෙම ස්වර ප්‍රස්ථාරය කුමන රාගයකට අයත් වේද?

(ii) | ධ - - කි - ක - න | මෙම තාල පදය සම්පූර්ණ කරන්න.

(iii) කෝකිල වන්නම ගැයෙන තිත් රූප දෙක නම් කරන්න.

(iv) මධ්‍යමය හා කෝමළ ධෛවතය අතර ඇති ස්වර දෙක නම් කරන්න.

(v) ස්නිධස්නිධප, නිධපනිධපම මෙහි ඊළඟ ස්වර ඛණ්ඩය කුමක්ද?

(vi) ම ධ ස ................................ කෝඩ් එකේ ස්වර තුනයි.

(vii) ග නි ප රි ධ ග යනු ................................ සුසරකරන ස්වර වේ.

(viii) නූර්ති නාට්‍යවල ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය ලෙස ................................ යොදා ගන්නා ලදී.

(ix) ''සෝබාව දේ මෙපුර සිරි විසිතුරු බලනු මිතුරු'' ................................ නාට්‍යයේ එන ගීතයකි.

(x) පාරමිතා බල, එන්න මදනලේ, කළිඳු ගංගා දෙනියේ යන ගීත තුනම ................................ රාගය ආශ්‍රය කරගෙන නිර්මාණය කරන ලද සරල ගීත වේ.

(xi) ගම සහ නිස ස්වර අතර අර්ධ ස්වර පරතර (Semitone) සහිතව ස්වර අටකින් සමන්විතවන්නේ ................................ ස්කේලයයි.

(xii) බිලාවල් රාගයේ යෙදෙන භූපාලි රාගයේ නොයෙදෙන ස්වර නම් කරන්න. (ල. 01 x12 = 12ල.)

02.

| මධ්‍යලය ගීතය | රාගය | යෙදෙන විකෘති ස්වර | වාදී - සංවාදී | ගානසමය |
|---|---|---|---|---|
| | | නැත | | රාත්‍රී ප්‍රථම ප්‍රහරය |
| මන නුවන් පිනන මේ | | | | |
| | භෛරවී | | | |
| | | | ග , නි | |
| සඳවති හිනැහෙනවා | | | | |

(i) ඉහත වගුවේ හිස්තැන්වලට අදාළ පිළිතුරු ලියන්න.

(ii) ඉහත වගුවේ හතරවැනි තීරයට (අංක 04) අදාළ රාගය හඳුනාගෙන එහි ආරෝහණ, අවරෝහණ, ස්වර සහ මධ්‍යලය ගීතයේ ස්ථායී කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

(iii) අංක 05 තීරයේ ඇති රාගය හඳුනාගෙන මධ්‍යලය ගීතයේ මුල් පදය සමඟ මාත්‍රා 08 තානාලංකාර දෙකක් ලියන්න.

(ල. 12 යි)

03.

| තී නා | ධා තු නා | ධා තිං තිං තා |
|---|---|---|

ඉහත වගුවේ දැක්වෙන්නේ විෂය නිර්දේශයට අයත් තාල තුනක අවන්ද්ධ අක්ෂර ඇතුළත් විභාග තුනකි.

(i) මෙම තාල තුන පිළිවෙළින් නම් කරන්න.

(ii) ඉහත විභාග තුන තුළ ඇති තබ්ලාවේ දහිනා (දායන්) කොටසින් පමණක් වාදනය කරන අක්ෂර ලියා දක්වන්න.

(iii) ඉහත විභාග තුන තුළ දක්නට ලැබෙන සමාන ලක්ෂණ දෙකක් ලියන්න.

(iv) මාත්‍රා අඩු සංඛ්‍යාවක් ඇති විභාගයට අදාළ කාලය තාල, සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.

(ල·12යි)

04. ස ග ම ප̣ ප නි ධ රි ස̇

(i) ඉහත ස්වර තාරතාවය අනුව පෙළගස්වන්න.

(ii) මෙම ස්වර ගිටාරයේ ස්වර පුවරුව මත ලකුණු කරන්න.

(iii) එම ස්වරවලින් සෑදෙන ඔබ ඉගෙනගත් කෝඩ්ස් ස්වර ලියා නම් කරන්න.

(ලකුණු 04 බැගින්)

05. | ස ග ප | ධ පුම ධ | ස ධ පුම | ග - - |

| නි̣ රි ප | ග - ස | ග - - | - - - |

(i) ඉහත ස්වර ප්‍රස්තාරය බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරන්න.

(ii) එහි එක් එක් විභාගයට අදාළ කෝඩ්ස් ලියා දක්වන්න

(iii) මෙම ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් ලියන්න.

(ලකුණු 04 බැගින්)

06. (i) නූර්ති ගීත සහ නාඩගම් ගීත අතර ඇති වෙනස්කම් 4ක් ලියන්න.

(ii) ස්වර පුවරු භාණ්ඩයක් ලෙස සර්පිනාවේ වැදගත්කම පිළිබඳ කරුණු 4 ක් ලියන්න.

(iii) පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ගීතය | ආශ්‍රය කරගත් රාගය | රාගයේ ස්වර සංගති |
|---|---|---|
| සවන් දී පෙර රාම චරිතේ අසව් | | |
| රකිනු ඊශ්වරා | | |
| අප ගුණසරු සිංහල භූපති | | |

(ලකුණු 12 යි)